මීගහකිවුල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 26 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 04 කට අදාල ණයහිමි ශේෂ රු.136,155 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගණනය කිරීමේ දෝෂය 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය රු.38,558 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා ජංගම වත්කම් අඩුවෙන් දැක්වේ. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | අත්හැරීමේ දෝෂය 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | විවිධ ණයහිමියන් 04 දෙනෙකු වෙනුවෙන් ගිණුම්වල රු.141,978 ක වෙන්කිරීම් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2018 වර්ෂයේ දී සිදුවූ මෙම දෝෂය 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.98,754,948 ක ස්ථාවර වත්කම් විෂයයන් 05 ක් සහ රු.5,141,503 ක ණයගැතියන් විෂයයන් 02 ක ඔප්පු, පිඹුරුපත් සහ පැවරුම් නියෝග, විස්තරාත්මක උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, පරිග්‍රහන ලේඛන, ශේෂ සහතික සහ කාල විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ වාර්තා, හිඟ උපලේඛන 2019 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

| | නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | -------------------- | -------------------------------- | -------------- | ------------------ |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | |
| | 158 හා 159 වගන්ති | කුලී, ජල ගාස්තු, ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු වලට අදාළව රු.1,125,034 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | ඉදිරි වර්ෂ වලදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | <u>1988 ප්‍රාදේශිය සභා(මුල්‍ය හා පරිපාලන)රීති සංග්‍රහය</u> | | | |
| | (i) රීති 114 | 2014 හා 2015 වර්ෂ වලදි ඉදිකිරිම් ව්‍යාපෘති සඳහා ග්‍රාම සංවර්ධන සමිති 05 කට අත්තිකාරම් ලෙස රු.494,031 ක් ගෙවා තිබුණු අතර, එම ඉදිකිරිම් ව්‍යාපෘති නිමකර හො සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අත්තිකාරම් පියවා හෝ නොතිබුණි. | අත්තිකාරම් ප්‍රතිපූර්ණය කරගත යුතුවේ. | අදාල පාර්ශවයන්ගෙන් අය කරමි. |
| | (ii)රීති 203,204 | 2018 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ වල සඳහන් ඌනතා භාණ්ඩ 61 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, ඒවායේ වටිනාකමද ගණනය කර නොතිබුණි. | ඌනතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදි ක්‍රියාමාර්ග ගනිමි. |
| (ඇ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| | (i) මුදල් රෙගුලාසි 110 | සමාලෝචිත වර්ෂයේදී හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලේඛනයක් පවත්වාගෙන යායුතුවේ. | ඉදිරියේදි සකස් කරමි. |
| | (ii) මුදල් රෙගුලාසි 1646 | වාහන 06 ක 2018 වර්ෂයට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | නිවැරදිව සකස් කිරීමට උපදෙස් දී ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,649,255 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,377,252 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 970,000 | 1,319,437 | 1,041,362 | 322,510 | 920,000 | 1,170,982 | 810,601 | 360,382 |
| (ii) | කුලී | 3,787,612 | 3,715,812 | 2,996,737 | 719,074 | 2,814,663 | 2,814,663 | 2,891,574 | 85,293 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 325,000 | 325,000 | 546,850 | - | 484,000 | 484,000 | 453,305 | 74,000 |
| (iv) | වෙනත් ආදායම් | 450,000 | 450,000 | 587,471 | 83,450 | 550,000 | 550,000 | 342,825 | 228,145 |
| | එකතුව | <u>5,532,612</u> | <u>5,810,249</u> | <u>5,172,420</u> | <u>1,125,034</u> | <u>4,768,663</u> | <u>5,019,645</u> | <u>4,498,305</u> | <u>747,820</u> |

2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට පැවත එන, ලැබිය යුතු ආදායම් ණයගැතියෝ රු.13,219,508 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම අය කර ගත යුතුවේ. | ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.1,304,794 කි. |

2.2.3 <u>කඩකුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩ කාමර 22 ක් සඳහා 2014 වර්ෂයේ නව සංශෝධිත තක්සේරුව පදනම් කරගෙන කුලී අය නොකර 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන කුලී අය කිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.63,530 ක ආදායමක් අහිමි වී තිබුණි. | බදු කුලී තක්සේරු කරගත යුතුවේ. | සංශෝධිත තක්සේරු කඩකුලියට ගිවිසුම් ගතවන අතර, අනෙකුත් කඩ හිමියන්ට නීතිමය ක්‍රියාමාර්ග ගනිමි. |

2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය සේවා කටයුතු සඳහා බාහිර පාර්ශවයකට කුලියට ලබාදීම වෙනුවෙන් අයවිය යුතු රු.290,500 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කරමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.3,300,000 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.92,842 ක් අය කර නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | අය කර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටද අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවාගෙන හෝ වැළඳ ගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම් සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමට නිලධාරින්ට උපදෙස් දුනිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 අගෝස්තු 12 වන දින කරමැටිය පෞද්ගලික ආයතනයක වැඩ බිමෙහි සේවයට යොදවා තිබුණු බැකෝ ලෝඩරය වෙනත් වාහනයක ගැටීම හේතුවෙන් සිදු වු අලාභය වෙනුවෙන් රු.28,905 ක් අය කරගෙන නොතිබුණි. | අලාභය අය කර ගත යුතුවේ. | අදාළ පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන, ගෙවිය යුතු රු 2,208,653 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කාලීනව නිරවුල් කළ යුතුවේ. | ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.4,156,888 කි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව පැවති පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඩොලමයිට් ව්‍යාපෘතිය සඳහා ඉදිකළ ප්‍රාදේශීය සභාවට අයත් වටිනාකම රු.533,100 ක් වු ගොඩනැඟිල්ල වසර 16 ක කාලයක් ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුනි. | ගොඩනැඟිල්ල ඵලදායි කාර්යයකට යොදා ගත යුතුවේ. | ඉදිරියේදී ඵලදායි කාර්යයක යොදා ගනිමි. |

3.5 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම හා සම්බන්ධ වන පරිදි වාර්ෂික අයවැය ලේඛනය සකස් කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ 2009(01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට එක් වතාවක් හෝ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි චක්‍ර ලේඛ අනුව කටයුතු කරමි. |